# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

සතිය -

විෂය - නර්තනය

13 ශ්‍රේණිය

සැකසීම: එම්.පී.ඩබ්.ආර්.මුතුගල
ර/ ගන්කන්ද මධ්‍ය විද්‍යාලය

## II වාරය

නිපුණතාව - 05 ශ්‍රී ලාංකීය සංස්කෘතිය හා සබැඳි ගායන වල පසුබිම අධ්‍යනය කරමින් ගායන කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම - 5.1 නර්තන අංග හා සබැඳි ගායන ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම - 5.1 ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායේ නර්තන අංග හා සබැඳි ගායන ඉදිරිපත් කරමු. (සුරපති වන්නම)

ඉගෙනුම් ඵල -

- නිර්දේශිත නර්තනාංග හා සබැඳි ගායන වල පසුබිම විස්තර කරයි.
- ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායෙහි නර්තනාංග වලට අදාළ කවි ගායනා කරයි.
- නර්තනාංග වලට අදාළ කවි නියමිත නාද මාලා අනුගමනය කරමින් බෙර වාදනයට අනුව ගායනා කරයි.
- වන්නම් / සිංදු වන්නම් නිවැරදි නාද රටා හා තාල අනුගමනය කරමින් ගායනා කරයි.
- කණ්ඩායම් වශයෙන් ඒකීය හැඩ තලයක පිහිටා ගායනා කරයි.
- ස්වකීය හැඩ තලයෙහි පිහිටා ඒකලව ගායනා කරයි.

ශිෂ්‍යා කළයුතු කාර්යයන් -

- ශ්‍රව්‍ය පට ආධාරයෙන් සුරපති වන්නම ශ්‍රවණය කරන්න උත්සාහ ගන්න.
- ගුරුවරයා හෝ ඉගෙනුම් ආධාරක මඟින් ශ්‍රවණය වන ගායනයට අදාළ නාද රටාව වටහා ගන්නට උත්සාහ කරන්න.

ඉහත ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක -

- 13 ශ්‍රේණිය නර්තන අතිරේක කියවීම් පොත
- දහඅට වන්නම - සී. ද. එස්. කුලතිලක
- **You Tube** නාලිකාව – https://youtu.be/mbk9B_8G1g4

ඇගයීම් -

- නිර්දේශිත නර්තන අංග හා සබැඳි ගායන වල පසුබිම විස්තර කරන්න.
- නර්තන අංග වලට අදාළ කවි නියමිත නාද මාලාව අනුගමනය කරමින් ගායනය කරන්න.
- සාමූහිකව හා ඒකලව අදාළ කවි ගායනය කරන්න.

පහත ඇගයීම් ද සිදුකරන්න.-

- සති පාසල් කාර්ය පත්‍රිකාව අංක 01 ස්වයං අධ්‍යාපනයට යොමුවන්න.

පසු ක්‍රියාකාරකම් -

- ශ්‍රව්‍ය පටයට ගායනා කරමින් අභ්‍යාස කරන්න.
- සාමූහික ගායනයක් ලෙස උදෑසන රැස්වීමේ දී ගායනා කරන්න.